03 SEP

# Non-Academic Vacancies (on Contract Basis) – University of Sri Jayewardenepura

3RD SEPTEMBER 2026 / UNCATEGORISED, VACANCIES

## පුරප්පාඩු

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මෙම විශ්වවිද්‍යාලයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් **2026.09.03** දින **පෙ.ව. 8.30** සිට **2026.09.17** දින **ප.ව. 4.00** දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

**කොන්ත්‍රාත් පදනම මත විගණන සහකාර**
**AUDIT ASSISTANT**

**සුදුසුකම් :**

1. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් හයක් (06) එකවර සමත් වී තිබිය යුතු අතර, පහත විෂයයන් සඳහා සම්මාන (Credit) සාමාර්ථ ලබා තිබිය යුතුය:-
    1. සිංහල භාෂාව / දෙමළ භාෂාව
    2. ඉංග්‍රීසි භාෂාව / ඉංග්‍රීසි සාහිත්‍යය
    3. ගණිතය

සහ

2. අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ සියලුම විෂයයන් (සාමාන්‍ය පොදු පරීක්ෂණ විෂය හැර) එකවර සමත් වී තිබිය යුතුය.

(පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03ක් එකවර සමත් වී තිබීම ද මේ සඳහා ප්‍රමාණවත් වේ.)

සහ

3. <u>තනතුරට අදාළ සුදුසුකම්:</u>

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (ICASL) Preliminary Level / Licentiate I / Foundation Level / CAB I / Executive Level හෝ ඊට සමාන සුදුසුකමක් ලබාගෙන තිබීම

හෝ

(ආ) වරලත් කළමනාකාරිත්ව ගණකාධිකරණ ආයතනයෙහි (CIMA) Foundation Level ලබාගෙන තිබීම

හෝ

(ඇ) ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනයේ (SLIATE) ගිණුම්කරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (HNDA) ලබාගෙන තිබීම

හෝ

(ඈ) ශ්‍රී ලංකාවේ ගිණුම්කරණ තාක්ෂණික ශිල්පීය ආයතනය (Association of Accounting Technicians of Sri Lanka – AAT) මඟින් පිරිනමනු ලබන (AAT) සාමාජිකත්වය ලබාගෙන තිබීම.

සහ

4. රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක විගණන කටයුතු පිළිබඳ අවම වශයෙන් වසර දෙකක (02) පළපුරුද්දක් තිබිය යුතුය.

පිළිගත් ආයතනයකින් ලබා ගත් මාස හයකට (06) නොඅඩු පරිගණක යෙදුම් පිළිබඳ පිළිගත හැකි සුදුසුකමක් ඇති අය සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

**වැටුප :- රු. 79,075.00 (සියලු දීමනා සමඟ)**

**බඳවා ගැනීම :-** සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

**වයස :–** අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**කොන්ත්‍රාත් පදනම මත තාක්ෂණික නිලධාරී (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය)**
**TECHNICAL OFFICER (ICT)**

**සුදුසුකම් :-**

1. අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් ඕනෑම විෂය ධාරාවක් යටතේ එක් වරකදී විෂයයන් තුනක් (03) සමත් වී තිබිය යුතුය.

සහ

2. තොරතුරු සන්නිවේදන හා බහු මාධ්‍ය තාක්ෂණය / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය / තොරතුරු තාක්ෂණය ක්ෂේත්‍රයේ හෝ ඊට සමාන ක්ෂේත්‍රයක තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් හෝ පිළිගත් ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම 5 වන මට්ටම (N.V.Q. Level 5) හෝ ඊට නොඅඩු මට්ටමක ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම.

- තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳ සේවා පළපුරුද්ද ඇති අයදුම්කරුවන් කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ

**සටහන :-** පාඨමාලාවට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (N.V.Q. Level) තහවුරු කිරීම සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (Tertiary and Vocational Education Commission) මඟින් නිකුත් කරන සමානතා සහතිකයක් (Certificate of Equivalence) උඩුගත කළ (Upload) යුතුය.

**වැටුප් පරිමාණය :- රු. 68,895.00 (සියලු දීමනා සමඟ)**

**බඳවා ගැනීම :-** ලිඛිත හා/හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

**වයස :–** අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

අයදුම්කරුවන් තම ඉපයීම් වලින් 10% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු අතර, විශ්වවිද්‍යාලය මගින් එකී ඉපයීම් වලින් 15%කට සමාන මුදලක් විශ්වවිද්‍යාලයීය අර්ථසාධක අරමුදලට බැර කරනු ලැබේ. එයට අමතරව 3%ක මුදලක් විශ්වවිද්‍යාලය මගින් සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලට බැර කරනු ලැබේ.

අයදුම්පත් මාර්ගගත ක්‍රමවේදය මඟින් පමණක් ඉදිරිපත් කළ යුතු අතර අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා මාර්ගගත ද්වාරය (Online Portal) **2026.09.03** දින **පෙ.ව. 8.30** සිට **2026.09.17** දින **ප.ව. 4.00** දක්වා විවෘතව පවතිනු ඇත. වැඩි විස්තර [https://www.sjp.ac.lk/vacancies](https://www.sjp.ac.lk/vacancies) වෙබ් පිටුව මගින් ලබා ගත හැකි අතර මාර්ග ගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා [https://hrms.sjp.ac.lk/vacancies/nonacademic/open](https://hrms.sjp.ac.lk/vacancies/nonacademic/open) වෙත පිවිසිය යුතුය.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව/විශ්වවිද්‍යාලයක/උසස් අධ්‍යාපන ආයතනයක/රාජ්‍ය දෙපාර්තමේන්තුවක/රාජ්‍ය සංස්ථාවක/ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවය කරන අයදුම්කරුවන් අයදුම් කරන ලද තනතුරට තේරී පත්වුවහොත් තමා සේවය කරන ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි බවට වූ තම ආයතනයේ ප්‍රධානී සහතිකය අයදුම්පත් ඉදිරිපත් කරන අවස්ථාවේ උඩුගත (Upload) කළ යුතුය.

සෑම අයදුම්කරුවෙකුම තමා විසින් අයදුම් කරනු ලබන සෑම තනතුරක් සඳහාම වෙන් වෙන් වශයෙන් ආපසු නොගෙවන පදනම මත රු**. 500.00** ක අයදුම්පත් ගාස්තුවක් ගෙවිය යුතුය. මෙම ගෙවීම මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ණයපත් / හරපත් (Credit/Debit Card) මඟින් සෘජුවම කළ හැකිය.

ඔබ මෙම ගෙවීම මහජන බැංකු ශාඛාවක් මඟින් සිදු කරන්නේ නම් මාර්ගගත අයදුම්පත අවසානයේ දක්වා ඇති පරිදි බැංකු පෝරමය (Bank Slip) පුරවා එම බැංකු **පෝරමයේ ඇති හේතුව (Purpose) සඳහා අයඳුම්පතට අදාල අනන්‍ය (Unique) ගෙවීම් යොමු අංකය (Payment Reference No.) සටහන් කිරීම <u>අනිවාර්ය</u> වේ.** පසුව එම බැංකු පෝරම උඩුගත (Upload) කළ යුතු අතර ඒ සඳහා පහසුකම් සලසා ඇත.

මෙම ගෙවීම මාර්ගගත බැංකු හර කිරීම් (Bank Transfer) හරහා සිදුකිරීම **නොකළ** යුතු බව කරුණාවෙන් සලකන්න.

අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලිවීම, සුදුසුකම් හා පලපුරුද්ද සනාථ කිරීම සඳහා අදාල සහතික වල පිටපත් උඩුගත (Upload) කර නොතිබීම, නියමිත අයදුම්පත් ගාස්තුව ගෙවා නොතිබීම, අයදුම්පතට අදාළ අනන්‍ය ගෙවීම් අංකය (Payment Reference No.) සඳහන් කර **නොමැති** බැංකු පෝරම උඩුගත (Upload) කර තිබීම හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ.

කිසියම් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා හෝ යළි සලකා බැලීම සිදු නොකෙරේ.

විමසීම් සඳහා රාජකාරි දිනවල **පෙ.ව. 08.30** සිට **ප.ව. 4.00** දක්වා **0112758212/102** දුරකථන අංක ඔස්සේ ඇමතිය හැක.

**ලේඛකාධිකාරී**
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
ගංගොඩවිල, නුගේගොඩ.
2026.09.01

Apply Now!